# 1958 අවුරුද්දේ ලංකාවේ කෘෂිකර්මාන්ත ප්‍රගමනය

1958 අවුරුද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිභොග ප්‍රතිපත්තිය වූයේ සත්ව නිෂ්පාදනය දියුණු කිරීමත්, බෝග වගාවන් හා සත්ව නිෂ්පාදනය අතර සම්බන්ධතාවය වැඩි කිරීමත් ය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කෙරුණ වියලි ගොවිතැන් ව්‍යාපාරයන් හා රජයේ ගොවිපලවල බෝග වගා සටහන් වල, මෙම නව ප්‍රතිපත්ති විශෙෂ වශයෙන් පෙනුනි. මෙම නව අදහස් අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඉඩම් පරිශීලන අංශයක් ඇති කිරීම අවශ්‍ය කරුණක් ලෙස පෙනුනි.

දිවයිනේ බෝග හා සත්ව නිෂ්පාදනයෙහි, දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ප්‍රතිඵල හා ව්‍යාප්ත උත්සාහයන්, මෙම වර්ෂය තුළදී වටිනා හැඟීමක් දක්වූහ· ව්‍යාප්ත ක්‍රියාවන්ට බාධා වූ ජාති හෙද කලහා හා බෝග වැඩීමට අහිතකර වර්ෂාපතනයක් ලැබද, වගාවූ බෝග වල අස්වනු හා ප්‍රමාණ වැඩිවීම වඩාත් විශ්මය ජනක දෙයක් සේ පෙනේ.

වී ගොවිතැනින් ලත් ප්‍රතිඵල විශෙෂයෙන් සතුටුදායක වේ. යල, මහ දෙකන්නේම අක්කරයකින් ලත් සාමාන්‍ය අස්වැන්න මෙතෙක් වී ගොවිතැනෙන් ලත් ප්‍රමාණය පැරදූහ. 1957-58 මාස් කන්නේදී දිවයිනෙහි සාමාන්‍ය අස්වැන්න වූයේ අක්කරයකට වී බුසල් 34.8 යි. මීට ප්‍රථම ඉතාම වැඩි අස්වැන්නක් වූ බුසල් 32.7 ලද්දේ 1956-57 මාස් කන්නේදීය· වගාවට එතරම් සුදුසු නැති විශාල ඉඩම් ප්‍රමාණයක් වැපුරුණු මහ 1957-58 දී අක්කර 8,38,000 වැඩ වූයේ, මහ 1956-57 දී අක්කර 7,78,000 වගාවූ අතරය. මීට පෙර යල් කන්නකට ලැබූ විශාලම සාමාන්‍ය අක්කර අස්වැන්න බුසල් 33.5 වූ නමුත් 1958 යලට බුසල් 35.5 ක අස්වැන්නක් ලැබුණි. මෙවැනි විශාල සාමාන්‍ය අස්වැන්නක් ලද්දේ, මාතලේ හැර දිවයිනේ අනිකුත් සැම පලාත් වලම වැඩි අස්වැන්නක් ගෙන දීමෙන් ය.

ලංකාව සහල්වලින් ස්වයංපෝෂිත කිරීමෙහි හැකියාව මෙතැන්·සිදී පරීක්ෂා කිරීම යෝග්‍යවේ. සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලද ක්‍රමය අනුව 1963 දී ලංකාවේ ජනගහනය ලක්ෂ 100 ක් ලෙස දල වශයෙන් ගැනිය හැක· වී බුසලක බර රාත්තල් 45ක්ද, වියෙන් කෙටෙන සහල් ප්‍රමාණය සියයට 68 ද, වර්ෂයකට ආහාර සඳහා කෙනෙකුට අවශ්‍ය සහල් ප්‍රමාණය රාත්තල් 198 ද වශයෙන් සැලකුවිට ලක්ෂ 100 ක ජන සංඛ්‍යාවකට අවුරුද්දකට වුවමනා වී ප්‍රමාණය බුසල් ලක්ෂ 647 යි. වර්ෂයකට වගාවන්නේ කුඹුරු අක්කර ලක්ෂ 11 ක් නම්·මුළු දිවයිනේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වී ප්‍රමාණය ලැබීමට බුසල් 58.9 ක සාමාන්‍ය අස්වැන්නක් වුවමනාය. මෙවැනි අස්වැන්නක් 1958 දී මහට දිස්ත්‍රික්කු 3 කද, යලට දිස්ත්‍රික්කු එකකද ලැබීම සතුටට කරුණකි. පොළොන්නරුව, බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කුවල වී බුසල් 59.3 ක, 61.2 ක හා 66·6 ක සාමාන්‍ය අස්වැන්නක් මහ 1957-58 ට ලැබුණි. පොළොන්නරුව දිස්ත්‍රික්කුවේ යල 1958 ට ලැබූ සාමාන්‍ය අස්වැන්න බුසල් 62.2 වේ.

පසුගිය අවුරුදු තුනේදී ලංකාවේ වී අස්වැන්න වැඩිවීම පහත සඳහන් සංඛ්‍යා ලේඛන වලින් පෙනේ.

**වී අක්කරයක සාමාන්‍ය අස්වනු ප්‍රමාණය බුසල් වලින්**

**මාස් කන්නය**

| *1955-56* | *1956-57* | *1957-58* |
|---|---|---|
| 30·9 ... | 32·7 ... | 34·8 |

**යල් කන්නය**

| *1956* | *1957* | *1958* |
|---|---|---|
| 28·4 ... | 31·8 ... | 35·5 |

1958 වී අස්වැන්නේ මනා දියුණුවක් ඇති වූයේ වැඩි වැඩියෙන් රසායනික පෝර යෙදීමෙන් හා කොළ පාලුවට ඔරොත්තු දෙන, රසායනික පෝර යෙදීමෙන් වැඩි අස්වනු ලැබෙන වී වර්ග වගා කිරීමෙන්ය.

රසායනික පෝර යෙදීමේ ප්‍රගමනය, සමුපකාර වෙළඳ ආයතන වලින් මිළදී ගත් පහතින් සඳහන් පෝර ප්‍රමාණයන්ගෙන් පෙනේ.

| වර්ෂය | මිළදී ගත් රසායනික පෝර |
|---|---|
| 1956 | ටොන් 14,204 |
| 1957 | ටොන් 17,048 |
| 1958 | ටොන් 19,425 |

1957 වර්ෂයේදී යාය ක්‍රමයට ඇරඹූ නුමුහුන් වී ව්‍යාපාරය ගොවීන්ට බෙදා දුන් විශාල සහතික බිත්තර වී ප්‍රමාණවලින් සම්පූර්ණයෙන් සපල වූ බව පෙනේ. 1957-58 මාස් කන්නේ නුමුහුන් වී ගොවිපලවල නිපදවූ බුසල් 64,180 න්, 57,880ක් ගොවීන්ට බිත්තර සඳහා විකුණන ලදී. මෙම ප්‍රමාණය 1957 විකුණූ බිත්තර වී ප්‍රමාණය සේ දෙගුණයක් පමණ වේ.

යල 1958 දී පෞද්ගලික නුමුහුන් වී ගොවිපලවලින් සහතික කරන ලද නුමුහුන් වී බුසල් 38,181ක් ගොවීන්ට අලෙවි කරන ලදී. මහ 1958-59දී නුමුහුන් වී ගොවිපලවල ප්‍රමාණය අක්කර 6,083 තෙක් නන්වන ලද හෙයින්, ඉන් ලැබෙන අස්වැන්න බුසල් 1,50,000 පමණ වේයයි බලාපොරොත්තු විය හැක.

ලංකාවේ කුඹුරු විශාල ප්‍රමාණයක වැඩෙන වල්, රසායනික පෝරවලින් ලැබිය හැකි නිසි ප්‍රයෝජන යටපත් කිරීම නිසා, මෙය වී අස්වැන්න නගාලීමට ඇතිවන තදබද බාධාවක් සේ පෙනේ. වැලිසර ගොවි උපකරණ හලෙහි වැඩ සාර්ථකව සමාප්ත වීමෙන්, මෙම තත්ත්වය විගස සතුටුදායක වෙනවා ඇත. දැනට නිෂ්පාදනය ආරම්භ කර ඇති එම කම්හල, වර්ෂයකදී නගුල් 30,000, පෝරු 30,000, වල් නෙලන යන්ත්‍ර 2,00,000 හා පේලියට වී වපුරන යන්ත්‍ර 20,000ක් ද නිපදවීම පිණිස සාදා තිබේ.

## උක්

කන්තලේ උක් ව්‍යාපාරයේ ප්‍රථම අවුරුද්දේ සිටවීමට නියමිත අක්කර 1,600 යථා කල්හි සිටවා සම්පූර්ණ කරන ලදී. මෙරට මීට ඉහතදී රජයේ දෙපාර්තමේන්තුවකින් මෙවැනි විශාල ව්‍යාපාරයක් කිසිවිට භාර ගෙන සාර්ථකව ඉටු කර නැත. මෙයින් ලැබෙන අස්වැන්න වන උක් දඬු පොඩි කිරීමට අවශ්‍ය කම්හලේ වැඩ 1959දී සමාප්ත නොවේයයි සිතීමට කරුණක් නැත. 1959දී නිපදවෙන සීනි ටොන් 5,000 සිට 6,000 දක්වා ප්‍රමාණය මෙරට මුල්වරට නිෂ්පාදනය වන ඉහල පෙලේ "සුදු සීනි" වෙයි.

## කපු

1958දී වගාවූ කපු අක්කර 6,000 මෙරට මෙතෙක් වගාවූ විශාලම ප්‍රමාණය වේ. මෙම සම්පූර්ණ ප්‍රමාණයම එච්.සී. 101 නමැති දෙමුහුන් වර්ගයෙන් වගාවූනි. මෙම වර්ගය මීට ඉහත වගාවූ වර්ගයට වඩා කොපමණ උසස්ද යත්, වැල්ලවත්තේ මෝලට ඇට කපු විකුණන මිළ, හොන්ඩරය රුපියල් 56 සිට 69 දක්වා වැඩි කර ගන්නා ලදී. මෙම කන්නේ කපු නිෂ්පාදනය වැඩි වීම නිසා වැල්ලවත්තේ මෝලට වුවමනා මධ්‍යම තරමට දිගු නූල් ඇති කපු සියල්ල සැපයීමට හැකි බවද පෙනේ.

## අර්තාපල්

රහන්ගල පර්යේෂණ ඒකාබද්ධ නිලධාරි විසින් හිටු මැරීම හා වයිරස් රෝග බොහෝ දුරට මැඩ පැවැත්වීමෙන් අර්තාපල් ව්‍යාපාරයේ දියුණුවට නව පණක් දෙන ලදී. රහන්ගලදී අක්කරයකට ටොන් 7ක සාමාන්‍ය අස්වැන්නක් ලැබුණි.

1957-58 දී අර්තාපල් වගාවූ ප්‍රමාණය සීඝ්‍රව වැඩි වුනි.

නුවරඑළිය දිස්ත්‍රික්කුවේ කඳපොල, ගල්පලම, මූන් ප්ලේන්ස්, රාගල, එල්ක් ප්ලේන්ස් සහ නුවරඑළිය යන ස්ථානයන්හි අක්කර සියයක් බැගින් බීජ අර්තාපල් ගොවිපල ඇති කිරීමට විධිවිධාන යොදා තිබේ. ලංකාව අර්තාපල් වලින් ස්වයංපෝෂිත කිරීම සඳහා අවශ්‍ය අක්කර 8,000 ට වුවමනා බීජ අර්තාපල් සියල්ල නිපදවීමට මෙම අක්කර ප්‍රමාණය සෑහේ.

### දුම්කොළ

මෙරට ප්‍රයෝජනයට වුවමනා සිගරැට් දුම් කොළ සම්පූර්ණ ප්‍රමාණය නිපදවීම සඳහා අක්කර 7,000 ක් වගා කළ යුතු වේ. 1957 වර්ෂයේදී වගාවූ ප්‍රමාණය අක්කර 5,000 කි. දෙපාර්තමේන්තුව අදහස් කරන්නේ වැඩිපුර උවමනා මේ අක්කර 2,000 වියලි කලාපයේ යල් කන්නේ වී සමග බෝග මාරු කිරීමෙන් සිටවීමයි. මැයි මාසයේ ඇතිවූ ජාති භෙද කලහ තිබියදීත්, පොළොන්නරුව දිස්ත්‍රික්කු වේ අක්කර 163 ක් යලට වගා කරන ලදී.

### තණබිම් හා කිරි නිෂ්පාදනය

පසුගිය වර්ෂයේ ඇරඹුණු තමන්කඩුව ව්‍යාපාරයේ ප්‍රගමනය සැලකිය යුතුයි. මෙම පෙදෙසේ ඇති ස්වාභාවික විල්ලු අක්කර 20,000 යේ, කිරි දෙනුන් 12,000 ක් අවුරුද්දේ මාස 9 ක කාලයක් පෝෂ්‍ය කළ හැක. විල්ලු ගං වතුරට යටවන නොවැම්බර් සිට පෙබරවාරි දක්වා ඇති මාස්වල උස් බිම් හි වගා කළ බ්‍රැකේරියා බ්‍රිසන්තා නමැති තණ සතුන්ගේ ආහාර පිණිස යෙදීමට උදව් වේ. 5,000ක කිරි හරක් පට්ටියක් ද, උන්ගේ පැටවු හා තර කිරීමට සතුන් ද ඇති කිරීම සඳහා මුල් පියවර යොදා තිබේ. ව්‍යාපාරයේ සංවර්ධ නය අවුරුදු 6 ක් තුළදී ඉටු කිරීමට අදහස් කෙරේ. මේ සඳහා මූලික වියදම් වශයෙන් රුපියල් ලක්ෂ 60 කටද, වාර්ෂික නඩත්තු වියදම් වශයෙන් රුපියල් ලක්ෂ 4 කටද වැය ලේඛනය තක්සේරු කර තිබේ. ව්‍යාපාරය සම්පූර්ණයෙන් සාර්ථක වූ විට අවුරුද්දකට දළ වශයෙන් රුපියල් ලක්ෂ 11 ක් වටිනා කිරි පයින්ට් 50 ලක්ෂයක් නිපද වේ. ලෝකයේ දියුණුව වැඩිවෙත්ම කිරි නිෂ්පාද නය හා ආදායම ද වැඩි වෙනවා ඇත.

### කුකුළන් ඇති කිරීම

1957-58 කාලයේදී දෙපාර්තමේන්තුව මගින් බිත්තර රැක්වීම සඳහා යෙදූ විධිවිධාන කොපමණ දියුණු වුවාද යත්, මසකට රැක්වූ බිත්තර ගණන 18,000 සිට 88,900 දක්වා වැඩිවී තිබේ. 1959 දී මෙම ප්‍රමාණය තව 58,800 කින් වැඩිවී සම්පූර්ණ ප්‍රමාණය 1,50,000 දක්වා ඉහලට යයි. මෙවැනි බිත්තර ප්‍රමාණයක් රැක්වීමෙන් මෙරට කුකුළන්ගේ සංඛ්‍යාව වැඩිවූ විට පිටරටින් ගෙන එන බිත්තර ප්‍රමාණය සම්පූර්ණයෙන් නැවැත් වෙනවා ඇත. දැනටද දෙපාර්තමේන්තුවේ උත්සාහ වලින් ප්‍රතිඵල තිබෙන බව පෙනෙන්නේ මීට ප්‍රථම පස් අවුරුදු කාලයේ දී ලංකාවට වර්ෂයකට පිටරටින් ගෙන්වූ බිත්තර ලක්ෂ 270 සිට 300 දක්වා ප්‍රමාණය 1958 දී ලක්ෂ 190 ට බැස තිබීම නිසාය. 1959 අවසානයේදී පිටරටින් ගෙන්වන බිත්තර ප්‍රමාණය සම්පූර්ණයෙන්ම නවතී යයි බලා පොරොත්තු විය හැක.

කුකුළන්ගේ ආහාර වලින් සියයට 40 ක් පමණ වන ධාන්‍ය වර්ග දුලබකම බිත්තර නිෂ් පාදනයට තදබල පහරක්ව තිබෙන හෙයින්, ගොවීන් මගින් ධාන්‍ය වැඩි වැඩියෙන් වගා කරවීමට හා රජය යටතේ පාලනය කෙරෙන ධාන්‍ය ගබඩා පිහිටුවීමට ද විධිවිධාන යොදා තිබේ.

### ට්‍රැක්ටර් සේවය

1956 වර්ෂයේදී ආහාර නිෂ්පාදන දෙපාර්ත මේන්තුවෙන් මෙම දෙපාර්තමේන්තුවට පව රන ලද කෘෂිකර්ම ට්‍රැක්ටර් සේවය, 1957 දී ද, කාර්යක්ෂමතාවයේ දියුණුවක් නොමැතිව හා විශාල අලාභද ඇතිව ක්‍රියා කිරීමට සිදු විය. යාන්ත්‍රික ඉන්ජිනේරු අධිකාරී සහ ප්‍රධාන ගනකාධිකාරී විසින් නිපදවූ ප්‍රතිසංවිධාන ක්‍රම යක් 1958 දී ක්‍රියාවේ යොදන ලදී. මෙම ක්‍රම යේ ප්‍රධාන කරුණු වූයේ ට්‍රැක්ටර් සංවිධාන යේ කටයුතු බෙදා හැරීමත් එම යන්ත්‍ර ක්‍රියා කරවීමේ භාරය එක් එක් කොට්ඨාශවල වී ගොවිතැන ගැන මනා දැනීමක් ඇති, වී ව්‍යාප්ත නිලධාරීන් තුළ පැවරීමත් වුනි. සුළු අළුත්වැඩියා කිරීම් කිලිනොච්චි, පොළොන් නරුව, කැකිරාව, ගන්නොරුව, බණ්ඩාර වෙල සහ හම්බන්තොට පිහිට වූ ක්ෂේත්‍ර රෙප යාර් ගබඩා වල කරන ලදී. ලොකු අලුත්වැඩියා වන් අනුරාධපුර කැන්ගරු ට්‍රැක්ටර් ස්ථාන යේ භාරය වුනි.

ප්‍රති සංවිධාන ක්‍රමය යෙදූ දින සිට ජනවා 1959 අතර කාලයේදී ලැබූ ආදායම වියදමට අධික විය. ආහාර නිෂ්පාදන දෙපාර්තමේන් තුව මගින් ට්‍රැක්ටර් සේවය ආරම්භ කළ දින සිට වියදමට වඩා ආදායම ඉක්මවූ ප්‍රථම

අවස්ථාව මේ යයි හැඟේ. මෙවැනි ලාභයක් ඇති වූයේ මෙම කාලයද බෝග වගාවෙන කාලයම වූ හෙයින් ය. ට්‍රැක්ටර් යන්ත්‍රවලට බෝග වගා නොවන සෘතුවේ මුදල් උපයන වැඩ සෙවීම, ප්‍රවාහන වැඩ වලට යෙදීම සඳහා ට්‍රේලර් රථ මිලදී ගැනීමෙන් විසඳේ. එසේ හෙයින් මෙම ක්‍රමයෙන් පුරා වර්ෂය තුළ නොකඩවා ට්‍රැක්ටර් වලින් ප්‍රයෝජන ගත හැකිවේ.

### වී ව්‍යාප්තිය

සම්පිණ්ඩනය කර තිබෙන පහත සඳහන් දත්ත, දියුණු ක්‍රමයෙදීමෙන් ලත් ප්‍රගමනය පෙන්වයි.

**දියුණු ක්‍රම යෙදීමෙන් වගාකළ වී අක්කර ප්‍රමාණය**

| | යල 1957 | මහ 1957-58 | යල 1958 | මහ 1958-59 |
|---|---|---|---|---|
| වගා කළ ප්‍රමාණය පැළ සිටවූ ... | 3,95,154 | 7,40,866 | 5,20,959 | 7,93,908 |
| (අ) සාමාන්‍ය ක්‍රමයට ... | 6,886 | 70,920 | 12,406 | 69,438 |
| (ආ) පේළිවලට ... | 2,501 | 16,851 | 4,473 | 24,671 |
| පේළියට ඇට වැපිරීම ... | 7,449 | 11,208 | 11,435 | 18,529 |
| වපුරා පෝරු ගෑ වල් නෙලූ ... | 13,213 | 23,885 | 19,892 | 25,651 |
| (අ) අතින් ... | 68,769 | 1,32,871 | 98,118 | 1,42,562 |
| (ආ) යන්ත්‍රයෙන් ... | 5,528 | 18,059 | 15,907 | 42,200 |
| රසායනික පෝර යෙදූ ... | 1,23,268 | 2,36,941 | 1,48,437 | 2,42,859 |
| ට්‍රැක්ටර් මගින් සීසෑ ... | — | 1,75,446 | 85,287 | 2,50,801 |
| නුමුහුන් වී වගාකළ ... | 64,477 | 2,03,350 | 80,644 | — |

### කුඹුරුවලට රසායනික පෝර යෙදීම

අවසාන වශයෙන් විග්‍රහ කළ විට, කුඹුරු වලින් වැඩි අස්වනු ලබා ගත හැක්කේ මෙසේ ය :

(අ) ඉතාම යෝග්‍ය රසායනික පෝර ප්‍රමාණය හා වර්ග යෙදීම,

(ආ) රසායනික පෝර යෙදීමෙන් වැඩි අස්වැන්නක් ලැබෙන වී වර්ග වගා කිරීම.

(ඇ) රසායනික පෝරවලින් මනා ප්‍රතිඵල ගෙනදීමට බාධක සාධකයන් අස් කිරීම. නිදර්ශන : වල් වැඩීම.

කෘමි රෝග ආදිය නැති කිරීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍යමුත්, වී වගාවෙන් ඉතාම හොඳ ප්‍රතිඵල ලැබෙන්නේ ක්‍රමානුකූල රසායනික පෝර යෙදීමෙන් ය.

1957 දී රසායනික පෝර යෙදූ අක්කර ගණන වූ 3,60,209 ය, 1958 දී 3,91,296 දක්වා නැන්වීම පමණක් නොව, එක් අක්කරයකට යෙදූ පෝර ප්‍රමාණයද 1958 වර්ෂයේදී වැඩි විය. සම්පූර්ණ ගොයමට 1957 දී හොණ්ඩර 3,60,940 වැටුන අතර 1958 දී හොණ්ඩර 4,53,934 ක් ලැබීමෙන් 1958 දී අක්කරයකට වැටුන පෝර ප්‍රමාණය හොණ්ඩර 1 සිට 1.2 දක්වා වැඩි විය.

1957 දී කුඹුරුවලින් සියයට 31.7ට රසායනික පෝර යෙදුන අතර 1958 දී එය 37.3 දක්වා වැඩි විය. රසායනික පෝර වඩාත් යෙදුවේ කෑගල්ල දිස්ත්‍රික්කුවේය. එහි යල 1958 ට සියයට 65.3ක හා මහ 1958-59 සියයට 80.6ක ද රසායනික පෝර යෙදන ලදී.

### නුමුහුන් වී වගාව

1957-58 මාස් කන්නේදී සහතික කළ බිත්තර වී බුසල් 64,180 ක් ගොවීන්ගෙන් මිළදී ගන්නා ලදී.

මහ 1957-58 කන්නේදී මිළදී ගත් නුමුහුන් වී වලින් බුසල් 57,800 ක් ගොවීන්ට අලෙවි කරන ලදී. 1957 වර්ෂයේදී ගොවීන්ට විකුණු

නුමුහුන් වී මෙන් මෙම ප්‍රමාණය දෙගුණයක් වීම සතුටට කරුණකි. එම සහතික කළ නුමුහුන් බිත්තර වී පර්යේෂණාගාරවල තීක්ෂණ පරීක්ෂණවලට භාජන වූ හෙයින්, මෙම ගණන් වඩාත් සැලකිය යුතුවේ.

පැලවීම ගබඩා කර තිබීමේදී බාල වූ හෙයින්, වී බුසල් 6,300 ක් පමණ අලෙවි නොකරන ලදී. වී ගබඩාවල තත්ත්වය දුර්වල තිබියදීත් තරක් වූ බිත්තර වී ප්‍රමාණය සියයට 10 ක් පමණ වීම සතුටුදායකය.

1958 යල් කන්නේදී සහතික කළ නුමුහුන් බිත්තර වී බුසල් 38,181 ක් ගොවීන්ගෙන් මිලදී ගන්නා ලදී.

1958-59 මාස් කන්නට පිහිට වූ නුහුමූන් වී ගොවිපලවල අක්කර 6,083 න් ජනප්‍රිය වියක් වූ මුරුන්ගාකායන් 302 න් අක්කර 4,597ක් වගා විය. පොඩි වී-ඒ 8 සහ මා වී-බී 11, කොළ පාලුව රෝගයට ඔරොත්තු නොදීම නිසා, ඒවා සින් වගාවූ අක්කර ප්‍රමාණය බොහෝ සෙයින් අඩු විය. කොළ පාලුව රෝගයට සාමාන්‍ය වශයෙන් ඔරොත්තු දෙන, රසායනික පෝර යෙදීමෙන් වැඩි අස්වනු ලැබෙන, පීටීබී—16 ක්‍රමයෙන් මේ වී දෙවගීය වෙනුවට වගා වෙනවා ඇත.

මහ 1958/59 වගාවෙන් සහතික කළ බිත්තර වී බුසල් 1,50,000 මිලදී ගත හැකි වේ යයි බලාපොරොත්තු වේ.

## 1958 වී අස්වනු

දිවයිනේ වී වගාවූ අක්කර ගණනේ සහ අස්වැන්නේ ක්‍රමවත් වැඩි වීමක් පෙනේ. වගාවූ ප්‍රමාණය 1957 මහට තුබූ 7,78,000, 1958 මහට 8,38,000 දක්වා වැඩි විය. මෙම කාලයේ දී සාමාන්‍ය අස්වැන්න ද බුසල් 33 සිට 35 දක්වා වැඩි වූහ. එක් එක් දිස්ත්‍රික්ක සැලකූ විට මන්නාරමේ සාමාන්‍ය වී අස්වැන්න වී බුසල් 22 සිට 47 දක්වා වැඩි වීමෙන් සියයට සියයක නැන්වීමක් පෙන්වයි. සැලකිය යුතු අස්වනු වැඩිවීම් බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කු වලද ලැබිණි.

දනට ලැබී තිබෙන දත්ත අනුව යල් කන්නේ වී අස්වැන්නද ඉතා සතුටුදායක වෙන බව පෙනේ. පසුගිය වර්ෂ හය තුළදී යලට ලැබූ සාමාන්‍ය අස්වැන්න සැමවිට මාස් කන්නට වඩා අඩු වූහ. නමුත් මෙවර පෙන්වූ අස්වැන්න වූ බුසල් 35.5 මාස් කන්නේ අස් වැන්න පරදයි. මෙම වැඩිවීම දිස්ත්‍රික්කු කීප යක අස්වනු සීඝ්‍රව වැඩිවීමෙන් නොව සැම දිස්ත්‍රික්කයේම අස්වනු ක්‍රමවත් ව වැඩි වී මෙන් බව දකීම වඩාත් සැලකිය යුතු කරුණකි.